# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

07 ශ්‍රේණිය | විද්‍යාව | ඒකකය 4 - ජලයේ ද්‍රාවක ගුණය

## A කොටස

**සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) ජලයේ ද්‍රාවක ගුණය ප්‍රයෝජනයට නොගන්නා අවස්ථාවකි,
1) හකුරු සෑදීම 2) විනාකිරි සෑදීම 3) සේලයින් සෑදීම 4) බැටරි ඇසිඩ් නිෂ්පාදනය

02) ජලයේ සිසිලනකාරක ගුණය ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවකි,
1) ශීත රටවල අයිස් මිදුනු ජලාශ වල පතුලේ ඇති ජලයේ මසුන් සිටීම.
2) වාහනවල විකිරකයට දමා ඇති ජලයෙන් එන්ජිම සිසිල් කිරීම.
3) සිසිල් බීම නිෂ්පාදනයේ දී යොදා ගැනීම.
4) ග්ලූකෝස් සෛල තුළදී ඔක්සිජන් සමඟ ප්‍රතික්‍රියාකර ශක්තිය නිපදවීම.

03) උක් යුෂය පිළිබඳ සත්‍ය වගන්තිය තෝරන්න.
1) ග්ලූකෝස් ද්‍රාවණයකින් ජලය වාෂ්ප කර ග්ලූකෝස් ලබා ගනී.
2) සුක්‍රෝස් ද්‍රාවණයකින් ජලය වාෂ්ප කර ග්ලූකෝස් ලබා ගනී.
3) සුක්‍රෝස් ද්‍රාවණයකින් ජලය වාෂ්ප කර සුක්‍රෝස් ලබා ගනී.
4) ග්ලූකෝස් ද්‍රාවණයකින් ජලය වාෂ්ප කර සුක්‍රෝස් ලබා ගනී.

04) ජලයේ දියවන ද්‍රව්‍ය යුගලය වන්නේ,
1) සීනි හා ඉටි 2) කොපර් සල්පේට් හා ලුණු 3) පිටි හා සීනි 4) පොල්තෙල් හා යූරියා

05) ජලජ පරිසර වල ජීවය පවත්වා ගන්නා ක්ෂුද්‍ර ජීවියෙකු නොවන්නේ,
1) ඇමීබා 2) පැරමීසියම් 3) ක්ලැමිඩමොනාස් 4) යීස්ට්

06) ජලය ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවක් නොවන්නේ,
1) මිනිස් සිරුර තුළ පෝෂක පරිවහනයට 2) ශාකවලට ඛනිජ උරා ගැනීමට
3) මිනිස් සිරුර තුළ යූරියා පරිවහනයට 4) සිරුරේ තැවරුණු ග්‍රීස් ඉවත් කිරීමට

## B කොටස

♣ **වරහන තුළ අති සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

**( ග්ලූකෝස්, උෂ්ණත්වමානය, සුක්‍රෝස්, යූරියා, රුධිරය, උක්, සූර්ය තාපය, අක්මාව, සිසිලනකාරන ගුණ, මීරා, සෝඩියම් ක්ලෝරයිඩ්)**

1) මුත්‍රා වල වැඩිපුරම අඩංගු බහිස්‍රාවී ද්‍රව්‍ය ....................................... වන අතර එය නිපදවනු ලබන්නේ ....................................... තුළදීය.

2) ලුණු ලේවායකදී ......................................... මගින් මුහුදු ජලය වාෂ්ප කිරීමෙන් ලුණු හෙවත් ................................. වෙන් කර ගනී.


3) ........................................................... යනු උක්වල, බීට් වල අඩංගු සීනි විශේෂයකි.

4) මිනිස් සිරුර තුළ ද්‍රව්‍ය පරිවහනයට ........................................................................ දායක වෙයි.

5) පොල් ශාකයේ මලෙන් ලබා ගන්නා ලද සීනි සහිත ද්‍රාවණය .......................................... ලෙස හැඳින්වෙන අතර අප රට තුළ සීනි නිපදවනු ලබන්නේ ......................................................... ගසේ සාරයෙනි.

## C කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




1) ලුණු ද්‍රාවණයකින් ලුණු වෙන්කර ගැනීමට සැකසූ ඇටවුමක් රූපයේ දැක්වේ.

i) A, B, C නම් කරන්න.

ii) මෙහිදී ඔබට ලැබුණු නිරීක්ෂණය ලියන්න.

iii) මුහුදු ජලයේ වැඩිපුර දියවී ඇති ලවනය නම් කරන්න.

iv) මෙම ලුණු ද්‍රාවණය පෙට්‍රි දීසියක දමා සකස් කළේ නම් එය තැබීමට සුදුසු ස්ථානයක් යෝජනා කරන්න.

v) මුහුදු ජලයෙන් ලුණු වෙන්කර ගන්නා ස්ථානය හඳුන්වන නම කුමක්ද ?

vi) එහිදී ජලය වාෂ්පකර ගැනීමට තාපය ලබාදෙන ප්‍රභවය කුමක්ද ?

vii) මෙලෙස මීරා වල ඇති ජලය වාෂ්ප කිරීමෙන් ලබා ගන්නා නිෂ්පාදන 2 ක් නම් කරන්න.

2) අනවශ්‍ය වචනය කපා හරින්න.

i) මුහුදු ජලය (ඝනීභවනය / වාෂ්පීභවනය) මගින් ලුණු ලබා ගත හැකිය.

ii) ආහාර ජීර්ණයෙන් ලැබෙන (පෝෂක / ඔක්සිජන්) ශරීරය පුරා පරිවහනය කරන්නේ රුධිරය මගිනි.

iii) අයිස් කැටයක් ඇල්ලූ විට අතට සිසිලසක් දැනෙන්නේ (අතෙන් / අයිස් කැටයෙන්) තාපය ඉවත්වීම නිසාය.

iv) (නිල් කුඩු / ලුණු කුඩු) ජලයේ වඩාත් හොඳින් දියවන ද්‍රව්‍යයකි.

v) උක් යුෂයෙහි ඇත්තේ (ග්ලූකෝස් / සුක්‍රෝස්) නම් සීනි වර්ගයයි.

*සැකසුම - කේ. වී. සී. ප්‍රියදර්ශනී මිය*